පරිසරය

## නගරයේ සිට නෑගම් යා හැකි වනාන්තරය

# කුරුළු කැලේ රක්ෂිතය

**ජෛව විවිධත්වය සම්බන්ධයෙන් කිසිදු අවතක්සේරුවකට භාජනය කළ නොහැකි කුරුළු කැලේ රක්ෂිතය තුළ දැනට ශ්‍රී ලංකාවේ දැකිය හැකි කුරුළු විශේෂ සංඛ්‍යාවෙන් 73 ක පමණ සංඛ්‍යාවක් නිරීක්ෂණය කළ හැකිය. මින් පක්ෂි විශේෂ 9 ක් පමණ ශ්‍රී ලංකාවට ආවේනික පක්ෂි විශේෂ ලෙස හඳුනාගෙන තිබේ.**



**කොන්ක්‍රීට් වහල වලට යටවූ නගරයේ පවතින අසහනකාරී පරිසරයට මැදිව සැමදා සිටීමට සිදුවුවහොත් වත්මන් මැද පන්තියේ මිනිසුන්ට ඔල්මාදය සෑදීම වැලැක්විය නොහැකි බවත්, ඒ නිසාම මේ යුගයේ ජීවත්වන සෑම මිනිසෙක්ම අවුරුද්දට වතාවක් දෙවතාවක් ස්වාභාවධර්මයාගේ සැබෑ ලෝකය වන වනාන්තරයට නෑ ගම් යා යුතුව ඇතැයි ද මීට දශක තුනකට පෙර මාධ්‍යවේදියකු පවසා තිබේ.**

**යූ.පී.එස්.පතිරණ**

එම ප්‍රකාශය සිහිපත් කෙරෙන සෑම අවස්ථාවකදී සෑම විටම නෑගම් යා හැකි නගරයකට මැදිවූ ස්වාභාවික වනාන්තරයක් පිළිබඳ මගේ මතකය අවදි වෙයි. එම වනාන්තරය නම් කෑගල්ල නගරය ආශ්‍රිතව පිහිටි කුරුළු කැලේ රක්ෂිතයයි.

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලනමය වශයෙන් කෑගල්ල අද ඉතා කාර්ය බහුල නගරයක්වී තිබේ. රජයේ කාර්යාල, ප්‍රධාන පාසල්, සිනමා ශාලා බැංකු, ආරෝග්‍යශාලා, උසාවි, බන්ධනාගාර, ප්‍රධාන වෙළදසැල් ආදී ආයතන රැසක් පිහිටා තිබීම නිසා පමණක් නොව නගරය හා අතුරු මාර්ග රැසක් සම්බන්ධවීම නිසාද එහි කලබලකාරී පරිසරය වඩාත් වර්ධනයවී තිබේ. එබඳු කලබලකාරී පරිසරයක් මැද්දේ කුරුළු පාරාදසයකටත් එහි ඉඩකඩ ඇත්තේදැයි කිසිවෙකුට සැක පහළ විය හැකිය. එහෙත් එබඳු කලබලකාරී නගරයක් තුළ කුරුළුකැලේ රක්ෂිතය නමින් ස්වාභාවික වනාන්තරයක් පිහිටා තිබීම ගැන සත්තකින්ම ආශ්චර්යෙකි.

කොළඹ -මහනුවර මහා මාර්ගයේ වාහනය තදබද සහිත කලබලකාරී කෑගල්ල නගරය මැදින් කෑගලු නගරය පසු කරනවාත් සමඟ දකුණු පස පිහිටි ඔරලෝසු කණුව ළඟින් ආරම්භවන බණ්ඩාරනායක මාවතේ කිලෝමීටරයක් පමණ ගිය කල කුරුළු කැලේ රක්ෂිතයට පිවිසිය හැකිය. මුහුදු මට්ටමේ සිට මීටර් 180 - 240 ක පමණ උසකින් පිහිටා ඇති මෙම ස්වාභාවික වනාන්තරයට හෙක්ටයාර් 9.3 ක පමණ භූමි ප්‍රමාණයක් අයත්වේ. බඹරකැලේ මූකලාන වශයෙන් හැඳින්වුනු මෙම වන පියස අභය භූමියක් බවට ප්‍රකාශයට පත්කර ඇත්තේ 1941 වර්ෂයේදීය. කෙසේ වුවද 1992 වර්ෂයේ සිට කුරුළු කැලේ රක්ෂිතය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතට පැවරී තිබේ.

ඉංග්‍රීසි එස් අකුරේ හැඩයට පිහිටා ඇති කුරුළුකැලේ රක්ෂිතය මැද තපෝවන ආරාමයක් පිහිටා තිබීම මගින් එම වනයේ ශාන්ත සිසිලසභාවය වඩාත් ඔප්නංවා ඇත. එම වනරොදට ඇතුළුවන මාර්ගයේ ළමා සතුටු උයනක් ස්ථාපිත කර ඇති අතරම ඉන් මඳක් ඔබ්බෙන් කෑගල්ල දිසා වන කාර්යාලයද පිහිටා තිබේ.

මි.මී 270 ක පමණ වාර්ෂික වර්ෂාපතනයක් ලබන කුරුළු



> කුරුළු කැලේ රක්ෂිතය වැදගත් වන්නේ ජෛව විවිධත්ව සංචිතයක් වශයෙන් පමණක් නොවේ. ජනගහන තදබදයෙන් හා වාහන තදබදයෙන් අඩුවක් නොමැති කෑගල්ල නගරයේ පාරිසරික තුල්‍යතාවය සුරැකීම සඳහා කාබන්ඩයොක්සයිඩ් අවශෝෂණයක් ලෙසද කුරුළු කැලේ වනාන්තරය මහඟු සේවයක් ඉටුකරයි.

කැලේ රක්ෂිතය ජෛව විවිධත්වය අතින්ද ඉතා ඉහලම මෙහෙයක් ඉටු කරනු ලැබේ. මෙම රක්ෂිතය තුළ ශාක විශේෂ 110 ක් පමණ හඳුනාගෙන ඇති අතර විශාල ශාක මෙන්ම පඳුරුමය ශාක හා වැල් වර්ගද බහුලව දක්නට ලැබේ.

වන වියන් ස්ථරය වඩාත් ඝනව පිහිටා ඇත්තේ මෙහි උතුරු කොටසේ වන අතර එම ප්‍රදේශයේ වියන් ස්ථරයේ විශාල ප්‍රමාණයක් වැල් වලින් වැසී පවතිනු දැකිය හැකිය. කුරුළු කැලේ බහුල වශයෙන් දක්නට ලැබෙන ශාක අතරට වල්දෙල්, ඇටඹ, කොස් , මැහෝගනී, පිහිඹිය, මිල්ල, කටුකිතුල්, සියඹලා, සූරියමාර, රුක්අත්තන , හවරියනුග, යන ශාක ඇතුළත්වී තිබේ. මෙම ශාක අතර ශ්‍රී ලංකාවට ආවේනික ශාක විශේෂ 25 ක්ද හඳුනාගෙන තිබේ. එපමණක් නොව පුස්වැල්, හිඟුරු, ගිරිතිල්ලා, තිත්ත, කබරෝස්ස , පෝටා, කුඩුමිරිස්ස ආදී වැල් වර්ග හා එරමිණියා, ලෝලු, සේරු, පිතිබරු, කැප්පෙටියා වැනි පඳුරු ශාක විශේෂ ද වේ.

මෙහි දැකිය හැකි වැල් අතුරින් පුස් වැල් ප්‍රමුඛස්ථානයක් ලබාගෙන ඇති අතර, මෙහි අක්කර 10 ක පමණ භූමි ප්‍රමාණයක් පුරා විහිද පවතින යෝධ පුස්වැල වසර 300 ක් පමණ පැරණි යැයි විශ්වාස කෙරේ.

සිංහරාජ වනයේ පැවති ප්‍රකට යෝධ පුස්වැල හැරණු විට දැනට ශ්‍රී ලංකාවේ දැකිය හැකි විශාලම පුස්වැල ලෙසද මෙය සැලකේ.

ජෛව විවිධත්වය සම්බන්ධයෙන් කිසිදු අවතක්සේරුවකට භාජනය කළ නොහැකි කුරුළු කැලේ රක්ෂිතය තුළ දැනට ශ්‍රී ලංකාවේ දැකිය හැකි කුරුළු විශේෂ සංඛ්‍යාවෙන් 73 ක පමණ සංඛ්‍යාවක් නිරීක්ෂණය කළ හැකිය.

මින් පක්ෂි විශේෂ 9 ක් පමණ ශ්‍රී ලංකාවට ආවේනික පක්ෂි විශේෂ ලෙස හඳුනාගෙන තිබේ. එම පක්ෂි විශේෂ අතරට ලංකා වලිකුකුළා, ලංකා මලිත්තා, ලංකා හබන් කුකුළා, කුරුළුගොයා, දුඹුරු සරටුකුස්සා, පතනුකුස්සා, ලබුගිරවා, දුඹුරු කැලෑ බස්සා, හා කන්දිග බස්සා ද ඇතුලත් වේ.

කුරුළු කැලේ රක්ෂිතය වැදගත් වන්නේ ජෛව විවිධත්ව සංචිතයක් වශයෙන් පමණක් නොවේ. ජනගහන තදබදයෙන් හා වාහන තදබදයෙන් අඩුවක් නොමැති කෑගල්ල නගරයේ පාරිසරික තුල්‍යතාවය සුරැකීම සඳහා කාබන්ඩයොක්සයිඩ් අවශෝෂණයක් ලෙසද කුරුළු කැලේ වනාන්තරය මහඟු සේවයක් ඉටුකරයි.

මේ නිසා නගරයේ අධික උෂ්ණත්වය අඩුකිරීම සඳහා ද දයක වන අතර ශ්‍රී ලංකාවේ නාගරික පරිසරයක් තුළ පිහිටි මෙනන් මෙබඳු වනාන්තරයක් හමුවන්නේද කලාතුරකිනි. නාගරික ජනතාවට කලබලකාරී හා ඒකාකාරී ජීවිත රටාවෙන් මදකට මිදී ගනට පමණක් නොව සිතටද සිසිලක් ලබා මද විවේකයක් ගතකිරීමට ද මෙම වනය සුව සෙවනක් සලසයි. පහසුවෙන් ළඟාවිය හැකි හා අධ්‍යයන ව්‍යාපෘති සදහා මෙන්ම දැනුම වර්ධනය කරගැනිම සදහා පාසල් හා සරසවි සිසුන්ට ඉවහල් කර ගත හැකි මහගු පරිසර පද්ධතියක් ලෙසද කුරුළු කැලේ රක්ෂිතය වැදගත් වේ.

සමස්තයක් වශයෙන් ශ්‍රී ලංකාවේ අනෙකුත් වන රක්ෂිත වලට බලපාන අතුරු අන්තරාවන් හා ගැටළු කුරුළු කැලේ රක්ෂිතයටද පොදුවේ බලපාන බව මෙහිදී අමතක කළ යුතු නොවේ.

පරිසරය සුරැකීමේ වැදගත්කම පිළිබඳව අවට ජනතාව මෙන්ම පැමිණෙන සංචාරකයන් දැනුවත් නොවීම නිසාම කුරුළු කැලේ අනාගත පැවැත්ම පිළිබඳව තර්ජනයක් පැන නැගී තිබේ.

විශේෂයෙන් රක්ෂිතයට අයත් ඉඩම් බලහත්කාරයෙන් අල්ලා ගැනීම, එහි වටිනා ඖෂධ පැළෑටි ආදිය ඉවත් කරගෙනයාම දර එකතු කිරීම මගින් ගස්වලට හානි පැමිණවීම, සතුන් දඩයම් කර ගැනීම සඳහා උගුල් ඇටවීම ආදිය විශාල තර්ජනයක් බවට පත්ව තිබේ.

මීට අමතරව කැලය වටා මහා මාර්ග පිහිටීම නිසා රාත්‍රී කාලයේ ඇදී එන සතුන් අනතුරු වලට ලක්වීමද සිදුවේ.

කෙසේ වුවද, පාරිසරික සංචරණය පිළිබඳව මුළු මහත් ලෝකය පුරා පිබිදීමක් හා දැනුවත් විමක් සිදු වෙමින් පවතින මෙම වකවානුවේ, නගර ආසන්නයක සිට පක්ෂීන් නිරීක්ෂණය කරමින් ස්වභාව සෞන්දර්ය වින්දනය කිරීමටත් ජෛව විවිධත්වය පිළිබඳව හැදෑරීමටත් පරිසර වේදීන්ට ශිෂ්‍යයන්ට හා සංචාරකයන්ට තෝතැන්නක් බඳු මෙම කුරුළු කැලේ රක්ෂිතය රැක ගැනීම කාලීන අවශ්‍යතාවයක් බවට පත්වී ඇති බව අවසාන වශයෙන් සඳහන් කළ යුතුය. ❑